(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **47.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

## 2022 ජූලි 20 බදාදා පූ.භා. 10.00 ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** වැඩබලන ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ධම්මික පෙරේරා මහතා,** ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **දිලුම් අමුණුගම මහතා**

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිදිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු සනත් නිශාන්ත මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1.**කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ගරු මන්ත්‍රීවරුනි, ව්‍යවස්ථාදායකයට මහජන ඡන්දයෙන් තේරී පත් වූ ජනතා නියෝජිතයන් ලෙස අප සියලු දෙනාටම අද දින පැවැත්වෙන පාර්ලිමේන්තු රැස්වීම මීට පෙර නොවූ විරූ ඓතිහාසික දිනයක් බව ප්‍රථමයෙන්ම ඔබ සියළුදෙනාගේම විශේෂ අවධානයට යොමු කරනු කැමැත්තෙමි. මෙම විශේෂ අවස්ථාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වශයෙන් සියළුදෙනා පමණක් නොව, අපගේ මුළු රටත්, මුළු ලෝකයත් අද දින පාර්ලිමේන්තුවේ සිදුවන්නේ කුමක්ද කියා වෙනදාට වඩා අවධානයෙන් පසුවන බව නොඅනුමානයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ආ) ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 7 ප්‍රකාරව, ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගනු ලැබීමේ අවස්ථාවකදී ඡන්ද පත්‍රිකා භාවිතයෙන් රහස් ඡන්දයක් පැවැත්වීමට පාර්ලිමේන්තුව විසින් 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අද රැස්වීමේදී වැඩ කටයුතු කරන බැවින් එම සියලු වැඩ කටයුතු සාර්ථකව අවසාන කරන තෙක් සියලුම මන්ත්‍රීවරයන් මනා සංයමයකින් යුතුව තමන්ගේ ආසනවල රැඳී සිටිමින් ආදර්ශමත් පාර්ලිමේන්තුවක් ලෙස කටයුතු කරන ලෙස අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කර සිටිමි.

ගරු මන්ත්‍රීවරුනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, රහස් ඡන්දය ප්‍රකාශ කිරීම නිසි අයුරින් අවබෝධ කරගෙන තම ඡන්ද පත්‍රිකාව වෙනත් කිසිවෙකුට ප්‍රදර්ශනය නොකරමින්, වගකීමෙන් යුතුව, නීති ප්‍රකාරව, බාධාවකින් තොරව අවසානය දක්වාම උපරිම සහයෝගය ලබාදෙන ලෙසත්, ඉල්ලා සිටින අතර කිසිදු ජංගම දුරකථනයක් ඡන්දය ප්‍රකාශ කරනු ලබන අවස්ථාවට රැගෙන ඒමෙන් වැළැකී සිටින ලෙසත්, සිය ඡන්දය හෝ ඡන්ද පත්‍රිකාව හෙළිදරව් කිරීම හෝ තම ජංගම දුරකථනය භාවිතා කරමින් ඔබගේ ඡන්ද පත්‍රිකාව ඡායා රූගත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 63 ව්‍යවස්ථාව යටතේ ඔබ විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ දෙන ලද ප්‍රතිඥාවටද පටහැනි බවද කිව යුතුය. එසේම, ඡන්ද විමසීමේ කාර්යයට අදාළව විවාද කිරීම හෝ රීති ප්‍රශ්න මතු කිරීම හෝ වෙනත් ආකාරයෙන් ප්‍රශ්න කිරීමට නීතියට අනුව සභාව තුළ අවස්ථාවක් නොමැති බවද තවදුරටත් දන්වා සිටිමි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝගවලට සහ අදාළ පනතේ විධිවිධානවලට අනුකූලව ඒවාට කිසිදු ආකාරයකින් පටහැනි නොවන අයුරින් අද

දින පාර්ලිමේන්තුව තුළ හැසිරීමට වගබලා ගතයුතු බවට පක්ෂ විපක්ෂ ඔබ සැම සියලුදෙනාගේම අවධානය යොමු කරවීමට අදහස් කරමි.

අවසාන වශයෙන්, අදාළ පනතේ විධිවිධාන ප්‍රකාරව, පාර්ලිමේන්තුව විසින් අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේදී පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා තේරීම් භාර නිලධාරියා වශයෙන් අද දවසේ ඡන්ද විමසීම් කටයුතු මෙහෙයවන බැවින් මහ ලේකම්වරයා ලබාදෙන උපදෙස් හා මඟපෙන්වීම්වලට අනුගත වෙමින් පූර්ණ සහයෝගය ලබාදීමට කටයුතු කරන මෙන්ද ඉල්ලා සිටිමි.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා තේරීම් භාර නිලධාරියා වශයෙන් අද දවසේ ඡන්ද විමසීම් කටයුතු මෙහෙයවීමට අවශ්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සභාගර්භයට කැඳවන බවද මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.''

ඡන්දය ප්‍රකාශ කරනු ලබන අවස්ථාවේ අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය පිළිබඳව මහ ලේකම්වරයා විසින් දැන් මෙම ගරු සභාව දැනුම්වත් කරනු ලැබේ.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පහත සඳහන් නිවේදනය කරන ලදී:-**

''දැනට පුරප්පාඩු වී තිබෙන ජනාධිපති ධුරය සඳහා නාම යෝජනා ඉදිරිපත් වී ඇති මන්ත්‍රීවරයන් අතුරින් යම් මන්ත්‍රීවරයෙකු තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම ආරම්භ කිරීමට ප්‍රථම වැදගත් කාරණා කිහිපයක් ඔබතුමන්ලාගේ කාරුණික අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර, හිස් ඡන්ද පෙට්ටිය මන්ත්‍රීවරුන්ට පෙන්වා මා විසින් ඊට අගුළු දමා මුද්‍රා තබනු ලැබේ.

ඡන්ද විමසීම ආරම්භ කළ විට, මා විසින් නම් කරනු ලැබූ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව පිළියෙළ කරන ලද බෙදුම් ලැයිස්තුවේ නම් අනුපිළිවෙළට ගරු කථානායකතුමාද ඇතුළුව එක් එක් මන්ත්‍රීවරයාගේ නම අඬගසනු ලැබේ.

මන්ත්‍රීවරයාගේ නම අඬගැසූ විට, මන්ත්‍රීවරයා ඉදිරියේ, පසු පිටේ මාගේ කෙටි අත්සන යොදා ඡන්ද පත්‍රිකාව අදාළ මන්ත්‍රීවරයාට ලබා දෙනු ඇත.

අනතුරුව, සභාගර්භයේ ඡන්ද ලකුණු කිරීමට සූදානම් කර තිබෙන කුටිය වෙත ගොස් එම ඡන්ද පත්‍රිකාව මත නිවැරදි ලෙස අදාළ මන්ත්‍රීවරයා විසින් තම ඡන්දය ලකුණු කරනු ලැබිය යුතුය.

ගරු මන්ත්‍රීවරුනි, ඡන්ද පත්‍රිකාවේ මන්ත්‍රීවරයා කැමති අපේක්ෂකයා ඉදිරියෙන් තිබෙන කොටුව ඇතුළත ඉලක්කම 1 වශයෙන් ලකුණු කිරීම අනිවාර්ය වේ. 1 ඉලක්කම හැර වෙනත් සලකුණක් එනම් කතිරයක් හෝ හරි ලකුණක් හෝ වෙනත් සලකුණක් යෙදුව හොත් ඡන්ද පත්‍රිකාව අවලංගු ඡන්ද පත්‍රිකාවක් බවට පත්වන බව සඳහන් කරමි.

ඊට අමතරව, අනෙකුත් ඡන්ද අපේක්ෂකයන් ඉදිරියේ තිබෙන කොටුව ඇතුළත 2, 3 යනාදී ඉලක්කම් අදාළ මන්ත්‍රීවරයාගේ මනාපයේ අනුපිළිවෙළ අනුව ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කළ හැකිය.

ගරු මන්ත්‍රීවරුනි, ඒ සමඟම යම් මන්ත්‍රීවරයෙකු විසින් ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් අවලංගු වන ආකාරය පිළිබඳව පනතේ විධිවිධාන ප්‍රකාරව ඔබතුමන්ලා දැනුම්වත් කිරීමට කැමැත්තෙමි.

මන්ත්‍රීවරයා හඳුනාගත හැකි යම්කිසි දෙයක් ලියා ඇති හෝ සලකුණු කර ඇති ඡන්ද පත්‍රිකාවක්;

තේරීම් භාර නිලධාරියා ලෙස මාගේ කෙටි අත්සන නොදරන ඡන්ද පත්‍රිකාවක්;

1 ඉලක්කම කොටුව ඇතුළත සලකුණු කරනු නොලැබූ ඡන්ද පත්‍රිකාවක්;

එක් ඡන්ද අපේක්ෂකයෙකුගේ නමට වඩා වැඩි ගණනකගේ නම ඉදිරියෙන් 1 යන ඉලක්කම ලකුණු කර ඇති ඡන්ද පත්‍රිකාවක්; සහ

සලකුණු නොකරන ලද හෝ අවිනිශ්චිතතාවය නිසා බල රහිත වන්නාවූ ඡන්ද පත්‍රිකාවක්

අවලංගු වන බව ඔබතුමන්ලාගේ කාරුණික අවධානයට යොමු කරවනු කැමැත්තෙමි.

ඊට අනුකූලව, නැවත වරක් මා ඔබතුමන්ලාට මතක් කිරීමට කැමතියි ඡන්ද පත්‍රිකාව මත 1 යන ඉලක්කම අනිවාර්ය බවත්, ඔබතුමන්ලාගේ මනාපයේ අනුපිළිවෙළ අනුව 2, 3 යනාදී ඉලක්කම් ලකුණු කළ හැකි බවත්, ඊට අමතරව, ඡන්ද පත්‍රිකාව මත වෙනත් කිසිම දෙයක් ලකුණු කිරීම හෝ ලිවීම ඔබතුමන්ලා විසින් නොකළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

එසේ නම් ගරු මන්ත්‍රීවරුනි,තේරීම් භාර නිලධාරියා වශයෙන් ඔබතුමන්ලාට ලබාදුන් උපදෙස් පිළිපදිමින් අපි දැන් ඡන්ද විමසීම ආරම්භ කරමු.

ඡන්දය පැවැත්වෙන අවස්ථාවේදී, සභාගර්භය තුළ නිශ්ශබ්දතාවය ආරක්ෂා කරමින් ඡන්දය ගණන් කිරීමට ඔබතුමන්ලාගේ පූර්ණ සහයෝගය ලබාදෙන මෙන් කාරුණිකව මෙයින් ඉල්ලා සිටිමි. තවද, මෙම ඡන්දය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අදාළ නීතිරීති යටතේ පවත්වනු ලබන පූර්ණ රහස් ඡන්දයක් වන බැවින් ඡන්ද පත්‍රිකාව ප්‍රදර්ශනය කිරීම හෝ ඡන්ද පත්‍රිකාවේ ඡායාරූප ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී වරදක් වන බව ද අවධාරණය කරනු කැමැත්තෙමි.

එසේ නම් ගරු මන්ත්‍රීවරුනි, අප ඡන්ද විමසීමේ කාර්යයට දැන් යොමු වෙමු. සාම්ප්‍රදායානුකූලව, මන්ත්‍රීවරයන් සභාගර්භයට කැඳවීම සඳහා දැන් බෙදුම් සීනුව මිනිත්තු 5ක් නාද කරනු ඇත.''

**2.1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම පැවැත්වීම.**

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම පැවැත්වීමෙහි සභාව නිරත විය.

ඡන්ද පත්‍රිකා ගණන් කොට, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසීමේ ප්‍රතිඵලය මතු පළවන අන්දමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරන ලදී:—

"ගරු මන්ත්‍රීවරුනි, 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා පවත්වන ලද ඡන්ද විමසීමට අදාළව සියලු ඡන්ද ගණන් කිරීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇත. ඊට අනුකූලව ඡන්ද ප්‍රතිඵල මා විසින් දැන් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ප්‍රකාශිත මුළු ඡන්ද සංඛ්‍යාව | - | 223 |
| ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව | - | 02 |
| දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාව | - | 219 |
| ප්‍රතික්ෂේප වූ ඡන්ද සංඛ්‍යාව | - | 04 |

ජනාධිපති ධුරය සඳහා තරඟ කරන ලද අපේක්ෂකයන් තිදෙනාට ලැබී ඇති ඒ ඒ ඡන්ද සංඛ්‍යාව මෙසේයි.

| | | | |
|---|---|---|---|
| ගරු ඩලස් අලහප්පෙරුම මහතා | - | ඡන්ද සංඛ්‍යාව | 82 |
| ගරු රනිල් වික්‍රමසිංහ මහතා | - | ඡන්ද සංඛ්‍යාව | 134 |
| ගරු අනුර දිසානායක මහතා | - | ඡන්ද සංඛ්‍යාව | 03" |

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අටවැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් ගරු රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුව විසින් ඒකාන්ත බහුතර ඡන්දයෙන් තෝරා පත් කරන ලද බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරන ලදී.

**3.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජූලි 27 බදාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජූලි 27 බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2022 ජූලි 27 බදාදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. කල් තැබීම:** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය'' යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා 1.36 ට, අද දින සභා සම්මතිය අනුව කථානායකවරයා විසින් 2022 ජූලි 27 බදාදා පූ.භා.10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.